# Living the LOTUS

## Buddhism in Everyday Life

12
2019
VOL. 171

Founder's Essay

## දෙයාකාරයේ ගෞරව කිරීම

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ, අගර්හිත බෝධිසත්වයන්ගේ පරිච්ඡේදයේදී ගල් වලින් ගැසුවත්, පොලු වලින් ප්‍රහාර දුන්නත්, එම පුද්ගලයාට ප්‍රතිප්‍රහාර එල්ල නොකර හදවතින්ම ගෞරව කලයුතු බව සඳහන් වේ. ඒ ආකාරයටම, තමාට හතුරුකම් කරන පුද්ගලයන්ට වුවද ගෞරව කළ යුතු බව දේවදත්ත පරිච්ඡේදයේ සඳහන් වේ. මෙම උදාහරණ 2ක අමතක නොකර සිටින්නේ නම්, නියම ශ්‍රද්ධාවන්තයෙක් ලෙස සුදුසුකම් ලබා ගැනීමට හැකිවේ යැයි සිතමි.

'මේ ආකාරයට විය යුතුය', 'අර ආකාරයට විය යුතුය' සේ තම පහසුව සඳහාම වන දේවල් ගැන පමණක් කල්පනා කරන විට, එම හැඟීම පිටතට පැමිණීමෙන් පුළුටු කරගත් මුහුණින් සිටින අවස්ථාවන් වැඩිවේ. අරක කොහොම වෙයිද, මේක කොහොම වෙයිද ලෙස සෑම විටම භයෙන් සිටින විට, එහි ප්‍රතිඵලය වුවද බොහෝ විට සිදු වන්නේ එම ආකාරයටමයි.

එම නිසා, කුමන ආකාරයේ දේවල් ඇති වූවත්, කොයි ආකාරයේ පුද්ගලයන් හා හමුවූවත් 'මෙය ධර්ම පුහුණුව සඳහා මට ලැබෙන අභියෝගයන්' සේ භාරගන්නා බවට හදවතින්ම තීරණය කරන්න.

ඒ ආකාරයට හදවතින්ම තීරණය කළවිට තම පහසුව ගැන පමණක් සිතා, මෙය හරිය හෝ මෙය වැරදිය, කැමති හෝ අකමැතියි ලෙස තේරීම් නොකර, හැම විටම අන්‍යයන්ට අනුකූලව කටයුතු කිරීමට හැකිවේ. එවිට ඇතිවන සෑම දෙයකටම මුහුණ දී, උපරිම කැපවීමෙන් කටයුතු කිරීම පමණක් ප්‍රමාණවත් බව තේරුම් ගැනීමට හැකිවේවි.

*Kaiso Suikan* 9, P. 194-195

**Living the Lotus**
**Vol. 171 (December 2019)**

Senior Editor: Koichi Saito
Editor: Kensuke Suzuki
Copy Editor: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by Rissho Kosei-kai International,
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලී සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# චතුර ලෙස කථා කිරීම



නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## වචන වල බලය

බයිබලයේ, 'යොහානාගේ ශුභ ආරංචිය' වන පලවෙනි පරිච්ඡේදය ආරම්භ වන්නේ 'පටන්ගැන්මේදී වාක්‍යයානෝ සිටිසේක' යන ප්‍රසිද්ධ වැකියෙනි. එසේම, වචන භාවිතය තුලින් මනුෂ්‍ය වන අපගේ හදවත් වර්ධනය වෙමින් හා පරිණාම වෙමින් පැමිණි බව පැවසිය හැකිය.

උපතේදී 'මනුෂ්‍යයෙකු' ලෙස තිබුණ හදවතට  අව්‍යාජ හැඟීම් හා අභිප්‍රායන් එක්කර, වචන භාවිතයෙන් අවට සිටිනා අය සමඟ කථාබහ කරමින් හා සන්නිවේදනය කිරීම තුලින් නියම 'මානුෂීය හැඟීම් වලින් යුතු හදවතක්' ඇතිවූවා වේ.

වචන වල ශක්තිය ඒ ආකාරයට ඉතා විශාලය. නමුත්, ෆුජි තෙරයමා නම් කවියා පවසන්නේ, ''වර්තමාන මනුෂ්‍යයන් තුල නැත්තේ 'කථා බහ කිරීම' නොව, 'මුනිවත රැකීමට' ඇති හැකියාව'' බවයි. එසේම, වචන භාවිතය සඳහා හදවත විකාශනය වීමේ වේගය අඩු වීමනිසා හෝ හදවත පිරිහීම නිසා, මනුෂ්‍යයන්ට හානි පැමිණවීමේ ආයුධයක් ලෙස වචන භාවිතා කිරීම වැඩිවී තිබේ. එක් අතකට වචන වලට ඉතා විශාල ශක්තියක් තිබෙන නිසා, වැඩි වශයෙන් වචන භාවිතා කරනවාට වඩා වැඩියෙන් මුනිවත රකිමින් තමා ගැන පසු විපරම් කර බැලීම වැදගත් යැයි සිතමි.

එසේනම්, මනුෂ්‍යයන් සමඟ වඩා හොඳ සබඳතාවයක් පවත්වා ගැනීම සඳහා, අපි කතා කල යුත්තේ මොනවාද, කුමන ආකාරයට දැයි යන්න අවබෝධ කර ගැනීම ඉතා වැදගත්ය.

## පුණ්‍ය තෙරුවන්ගෙන් ඉගෙන ගනිමු

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ, 'භික්ෂු 500 නමකට විවරණ දීම' යන 8 වන පරිච්ඡේදයේදී, බුදුන් වහන්සේ විසින්, ධර්ම දේශකයන් අතරින් ප්‍රමුඛස්ථානයේ සිටින පූර්ණ තෙරුණ්ට 'ඔබ හා සමානව ධර්මය විවරණය කළ හැකි වෙනත් කිසිවෙකු නැත්තේය' සේ පවසන වැකියක් ඇත. 'මෙම පුද්ගලයා සතුටට පත්විය යුතුයි' සේ ප්‍රාර්ථනා කරමින් හදවතින්ම ධර්මය දේශනා කළ පූර්ණ තෙරුණ් වහන්සේගේ වදන්, මනුෂ්‍යයන්ගේ සිත් සතන් වල රැව් දෙන්නට ඇත.

උන් වහන්සේ දේශනා කලේ, 'මනුෂ්‍යයන්ගේ හදවතට සතුට ලබාදෙමින්', 'ධර්මය ශ්‍රවණය කරන්නාවූ එක් එක් පුද්ගලයාගේ අවබෝධ කරගැනීමේ හැකියාව අනුකූලව' හා 'වැදගත් කරුණු සැමටම අවබෝධ වන ආකාරයට' ය. වෙන කෙනෙකුට එය කිසිසේත්ම කළ නොහැකිය.

'චතුර ලෙස කථා කිරීම' යනු, දැනුම හා හැකියාවන්ගෙන් යුතු පුද්ගලයන්, දිය සීරාවක් ගලා යනවා සේ කතා කිරීම නොවේද?

ඊටත් වඩා වැදගත් වන්නේ, අසා සිටින අයගේ මුහුණට ඉබේම සිනහවක් පහල වන ආකාරයට නම්‍යශීලි ස්වරූපයෙන් වචන භාවිතා කිරීමයි. එසේ වූ විට, තමා භාවිතා කරන වචන කාරුණිකත්වයෙන් පිරී පවතින බැවින් භාර ගැනීමට පහසු වනවා සේම, අසා සිටින අයගේ හදවතට බද්ධ වේ. අන් අය ගැන සිතනා විට, ඔවුන්ගේ හැඟීම් වාගේම, ජීවන රටාව ගැනද සැලකිලිමත් වන නිසා, එම අවස්ථාවන් වලදී භාවිතා කරන වදන් පූර්ණ තෙරුන් වහන්සේට දෙවෙනි නොවන ආකාරයේ ශක්තියක් උද්දීපනය වේ යැයි සිතමි.

එහෙත්, අපට තිබෙන විශාලම බාධකය වන්නේ 'වැදගත් කරුණු සැමටම අවබෝධ වන ආකාරයට' පැවසීම යන කොටසය.

ගත් කතුවරයෙකු වන හිසෂි ඉනොවුඑ මහතා සදහන් කරන්නේ 'අසීරු කරුණු සරළ බවින්, සරළ කරුණු ගැඹුරින්' පැවසිය යුතු බවයි. එසේ බුද්ධ කාලයේ සිට වර්තමානය දක්වා මිනිසුන් සමඟ සන්නිවේදනයේ යෙදෙන මූලික කරුණු වල වෙනසක් නොවේ.

එනමුදු, ධර්මය දේශනා කිරීමේදී 'වැදගත් කරුණු සැමටම අවබෝධ වන ආකාරයට සරළව' පැවසීම ඉතා අසීරු යැයි සිතමි.

හිසෂි ඉනොවුඑ මහතා සදහන් කර ඇති තවත් වැදගත් කරුණු 2 ක් වන්නේ, 'පැහැදිලිව, සරළව' හා 'තමාට ආවේණික වු ශෛලියෙන්, තමාගේම වචනයෙන්' යන්නයි.

අපගේ අත්දැකීම්, අපටම ආවේණික ශෛලියෙන් පැවසීමට හැකිය. දැනුන සතුට හා හැඟීම් නිහතමානීව පැවසිය හැකිය. අංගසම්පූර්ණ පුද්ගලයන් නොසිටින නිසා, ධර්ම කරුණු පවා හොදින්ම අවබෝධ නොවූවත්, 'කෘතවේදීයි', 'සතුටුයි' යන හැඟීම් සමගම, තමා අවබෝධ කරගත් ප්‍රමාණයට අන් අයට කියා දීම 'වැදගත් කරුණු සැමටම අවබෝධ වන ආකාරයට' පැවසීම වේ.

මෙම වර්ෂයේදී ඔබගේ හදවතට තදින්ම දැනුන දෑ මොනවාද? එසේම, කුමන 'වැදගත් දේ' අන් අයට පවසනවාද?

From *Kosei*, December 2019.

# ධර්මය තුලින් මා ඉගෙනගත්, කෝපය පාලනය කරගැනීම හා හදවත පිරිසිදු කර ගැනීම

රුමන් බරුවා මහතා
රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය, බංගලාදේශ ශාඛාව

*මෙම සෙප්පෝව 2019 නොවැම්බර් මස 01 වන දින දයිසෙයිදෝවේ පැවැත්වූ ගොමෙයිනිච් දින ඉදිරිපත් කරන ලද්දකි.*

මම බංගලාදේශ ධර්ම ශාඛාවේ කොක්ස් බසාර් ප්‍රදේශිය ශාඛාවේ සිට පැමිණි රුමන් බරුවා.

මම බෞද්ධ පවුලක උපත ලැබිය. දෙමව්පියන්, අක්කා, අයියා ඇතුළුව පවුලේ 5 දෙනෙකින් යුත් පවුලේ බාලයා වූ මට සැමගෙන්ම ආදරය කරුණාව නිතැතින්ම හිමිවිය. නිදහසේ ජිවිතය ගත කරමින්, අයියාවත් අක්කාවත් මට වුවමනා ලෙස මෙහෙයවුවා. මම මට කැමතිදේ මට ලැබෙන තුරු එය දැඩිසේ ඉල්ලා සිටින කෙනෙක් විය.

පාසල් යන අවදියේ මම සැම දිනකම බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගි විය. එම නිසා යහළුවන් අතර ජනප්‍රිය කෙනෙක්විය. මම බාහිර ක්‍රියාකාරකම් වලින් කැපී පෙනෙන්නට වූ නිසා, ප්‍රදේශයේ දේශපාලඥයෙකුගේ අවධානයට ලක්වී, එම දේශපාලඥයාගේ කණ්ඩායමට එන්න යැයි ආරාධනා කලා. මම එම කණ්ඩායමට ඇතුළු වුනත්, ඊට සමගාමීව පාසලේ කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉතා භායනක තත්වයකට පත්විය.

එම නිසා මම ඉස්ලාම් මූලධර්මවාදි කණ්ඩායමක, ඉලක්කයක් බවට පත්විය,මගේ ජිවිතයේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම මෙන්ම, උසස් අධ්‍යාපනය සඳහා දෙමව්පියන් මාව රුසියාවට පිටත් කලා. එය හාත්පසින්ම වෙනස් ලොකයක් මම පුදුමයට පත් වුනා. රුසියාව සොබාදහමෙන් පොහොසත්, ලස්සන රටක් විය. මම සිතා සිටියාට වඩා බෙහෙවින් වෙනස්, නිස්කලංක, සන්සුන් රටක්විය.



*නොවැම්බර් 01 වන දින දයිසෙයිදෝවේදී සෙප්පෝව පවත්වන රුමොන් මහතා*

රුසියාව කොමියුනිස්වාදී රටක් වුනත්, සැම ආගමක්ම තමන්ගේ ආගම ව්‍යාප්ත කිරීමට වෙහෙසෙමින් සිටියා. මට විවිධ ආගමික ස්ථානවලින් ආරාධනා කලද, බෞද්ධ ස්ථානයකින් එක ආරාධනාවක්වත් නොවිය.

එක දවසක්, යහළුවෙක් සමග ක්‍රිස්තියානි පල්ලියක් බැලීමට ගියා. පල්ලියේදි විශිෂ්ට දේ ඉගෙන ගෙන, ක්‍රිස්තියානි ආගමේ දයාව ඉගෙනගැනීමට හැකිවුනා.

මෙම පල්ලියේදී පෝලන්ත ජාතිකයෙක් හමුවිය. ඔහු සත්‍යවූ ඇදිහිලි ක්‍රමයක් සොයමින් සිටියා. 'මම බෞද්ධයෙක්' කියා කියූ විට, ඔහු මගෙන් බුදුදහම පිළිබඳ විමසීම් කලා.

එම විමසීම් අසා මම ලැජ්ජාවිය. ඇයි කියනවානම්, මම බුදුදහම හොඳින් දැන නොසිටි නිසා. ඔහුගේ ප්‍රශ්න වලට පිළිතුරු දීමට නොහැකි වූ විට, 'ඉක්මනට නවාතැනට යන්න ඕනේ' යැයි කියා නවාතැනට ගියා. වෙනත් දවසකද ඔහුව හමු වූ විටද, කලින් වගෙම කියා නවාතැනට ගියා. ඔහුට බුදුදහම පිළිබඳ කියා දීමට නොහැකි වූ නිසා, මම මටම දොස් කියා ගත්තා. මම හොඳින් බුදුදහම දැනසිටියානම් ඔහුට බුදුන් වහන්සේගේ ධර්මය කියාදී, ඔහුගේ හදවතට සහනක් දීමට හැකි වුවා යැයි සිතෙනවා.

මම රුසියාවේ බෞද්ධ සංවිධානයක් සෙව්වා. එහෙත් අවාසනාවට රුසියාවෙ බුදුදහම කියාදෙන එක සංවිධානයක්වත් නොවීය. රුසියාවේදී ලැබූ මෙම අත්දැකීම නොතිබුනානම්, මම නික්යෝ නිවානෝ තුමාගෙ ඉගැන්වීම්, සත්‍ය වූ බුදුදහම ඉගෙනගන්න නොලැබුනා යැයි සිතමි. මම කෝසෙයි කායි සාමාජිකයෙකු බවට පත් වීම, මාගේ ජිවිතයේ මම ලැබූ හොදම අවස්ථාව යැයි සිතනවා.

මම ආගම් ඇදහීමට අකැමැති වූ හේතුව පවසන්නම්. මම බෞද්ධ පවුලක ඉපදුනද, සැබෑ බෞද්ධයෙක් නොවිය. මගේ රටේ බුදුදහම රජය විසින් අනුමත කර ඇති නිසා පවුලේ අයත් මමත් බෞද්ධ විය. පාසලේදීත් බුදුදහම ටිකක් ඉගෙනගත්තා. එහෙත් මගේ ඇදහීම නම් විභාහයට කලින් බුදුන්වහන්සේ ඉදිරියට ගොස් හොඳට ලකුණු ගැනීමට හැකි වේවා යැයි වැදීමයි.

මම 'පෙරහැර දවසට' ට ඉතාමත් කැමතියි. මම හොඳ කණ්නාඩි දෙකක් දාගෙන, හොඳ පෙනුම තියෙන ඇඳුමක්

ඇඳගෙන, වටිනා සපත්තු දෙකක් දාගෙන, පන්සලට ගොස්, බුදුන් වහන්සේට වැඳ නමස්කාර කර ඉන්පසු, ගැහැණු ළමුන් සමඟ විනෝදයෙන් ගතකලා.

මම, ගමේ පැවැත්වූ සෑම බෞද්ධ වැඩසටහනකටම අනිවාර්යයෙන්ම සහභාගි වුනා. මට 'බුදුන් වහන්සේගේ ධර්මය ඇසීමෙන් පමණක් පිං ලැබෙනවා' කියා සිතා සිටියා. එය සෑම විටම මතක්විය. නරක වැඩ කළහොත් අපායටද, හොඳ වැඩ කළහොත් දිව්‍ය ලෝකයේටද යාමට පුළුවන් යැයි ඉගෙන ගත්තා.

ළමා කාලයේ මම සෑම විටම බොරු කිව්වා. ඒ වැරදි වැඩ නවත්වන්න ඕනා යැයි සිතා බෞද්ධ වැඩසටහන්වලට සහභාගි වුනා. එහෙත් එම වැඩසටහන් වලට සහභාගි වුනත් හාමුදුරුවන් වහන්සේලා සූත්‍ර කියනවා පමණක් විය. මට එම සූත්‍ර වල තේරුමද දන්නේ නැති නිසා, අනික් හැමෝම සාදු සාදු කියන විට, මමත් ඒ ආකාරයට පැවසුවා. පැය දෙකේ වැඩසටහන පැය 5-6 ක් වන අවස්ථාවන් වැඩිවිය. සහභාගිවන්නන් එකම දෙය නැවත නැවත කතා කරමින් සිටිනවා. එසේ වුනත් සහභාගි වී, වැඩසටහන අවසාන වනතෙක් වාඩි වී සිටිය යුතු විය. අතර මගදී නැගිට ගියහොත් ලොකු වැරැද්දක් යැයි කියා සිටියා. ඉන්පසු මම ධර්ම වැඩසටහන් වලට සහභාගි වුයේ නැත.

එවන් කරුණු නිසා, මම ආගම් පිළිබඳ පිළිකුල් සහගත තත්වයකට පත් වුනා. නමුත්, එම පිළිකුල් සහගත තත්වය නැතිවූ තැන, නෑදැයෙකු වන බොජි බරුවාගේ ආරාධනයෙන් කෝසෙයි කායි සංවිධානයේ බෞද්ධ වැඩසටහනකට සහභාගි විය. මම අළුත් හැඟිමකින් කටයුතු කළා. ටික කළක් ගත වුන විට මට ප්‍රදේශයේ තරුණ නායකකම ලබා දුන්නා.

ධර්මය ඉගෙනගෙන, අන් අයට ධර්මය කියාදීම මාගේ අභියෝගය විය. සාම්ප්‍රදායික බුදුදහම තුළ නික්යෝ නිවානෝගේ ඉගැන්වීම් කියාදීම අමාරු දෙයක් විය. තරුණයන්ව ඉලක්ක කර ගත්තා. තරුණයන්ගේ හදවත ඉතාම අවංකයි. මම කියනා දෙය හොඳින් අසාගෙන සිටියා. කොක්ස් බසාර් වල තරුණයන් 4 දෙනෙකු සමඟ, ගමින් ගමට, කඳු තරනය කරමින් ගමන් කළා. විවිධ ස්ථාන වල තරුණ කණ්ඩායම් ස්ථාපිත කරමින්, අවුරුදු 2 ක් තුළ විශාල ජාලයක් ඇති කරගැනීමට හැකිවිය. එය තරුණ කණ්ඩායම විශාල ශක්තියක් විය.

මේ කාලයේ මට, ආරිතොමි පෙර කියෝකයිචෝ සාන් තරුණයන් 10000 ක තරුණ හමුවක් පවත්වන්න යැයි කියා සිටියා. මම එය එකවිටම ප්‍රතික්ෂේප කළා. එවිට කන්චන් බරුවා ශිබුචෝ සාන් 'අපිත් ඉන්න නිසා භය වෙන්න එපා' යැයි කියා සිටියා. 'තරුණයන් 10000 ක හමුවක් පවත්වමු' යන ඉරියවු වලින් සිටින අරිතොමි කියොකයොචෝ සාන්ගේ මුහුණ දැක, තරුණ රැළිය පැවැත්වීමට අධිෂ්ඨාන කරගත්තා. එම රැළියට කෝෂෝ මැතිණිය ආරාධිත අමුත්තෙකු ලෙස පැමිණෙන බව දැනගෙන සිත කලබල විය. මාස 6 කට පසු හොඳින් තරුණ හමුව පැවැත්වීමට හැකි විය. 13000 ක පමණ තරුණ පිරිසක් සහභාගි වී තිබුනා. එය මෙතෙක් බංගලාදේශය තුල පැවැත් වූ විශාලතම බෞද්ධ හමුවයි. මෙම හමුවේ පිහිටෙන්, තරුණ කණ්ඩායම් නායකයන් විශාල පිරිසක් බිහිවුනා. රිෂ්ෂෝ කෝසෙයි කායි යන නාමය රට පුරා පැතිරුණා. මම මේ හමුව තුලින් ගොඩක් දේ ඉගෙන ගත්තා.

තරුණ හමුවේ වැඩකටයුතු පටන්ගත් විට, එයට බාධා කරන අයද සිටියා. බොහෝ බාධාක වලින් පීඩා විඳිමින් මට මගේ ජීවිත අවධානමද දැනුනා. යහළුවන් මා ගැන ඊර්ෂ්‍යාවෙන් බාධා කරමින් කටයුතු කළා. මම මේ දේවල් නිසා කිහිප සැරයක්ම තරහා ගනිමින්, දුක් වුනා. නමුත් මම අරිතොමි කියොකයිචෝ සාන්ගේ වචන වලින් දෙයක් තේරුම් ගත්තා. කියොකයිචො සාන්, 'ධර්ම ව්‍යාප්තිය කිරීම ලෝකයේ තිබෙන අමාරු කාර්යයක්' යැයි පැවසුවා. බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන විටද එය ලෙහෙසි පහසු කාර්යයක් වුනෙ නැහැ, නික්යො නිවානෝ තුමා ලෝක ආගමික නායකයන් සමඟ සමුළුව පැවැත්වීමට ආගමික නායකයන්ට ඒත්තු ගැන්වීමට කටයුතු කල විටද, හිතා ගන්නට බැරි විවිධ ප්‍රශ්ණ වලට මුහුණ දීමට සිදු වුනා. සෑම හොඳ වැඩ කටයුත්තකදීම බාධා පැමිණීම සාමාන්‍ය දෙයක් බව මේ තුලින් තේරුම් ගැනීමටහැකි වුනා.

'මේ ලෝකය දුක් කම්කටොළු වලින් පිරී තිබේ' යැයි බුදුන් වහන්සේ දේශණා කළා. මිනිසුන් සෑම විටම ආත්මාර්ථකාමීව, මිනිසුන්ගේ වැරදි තැන තැන කියති. අපි සාමන්‍යයෙන් සිතුවේ නැති වුනත්, මඩ ගොහුරේ ලස්සන නෙළුම් මල් පිපෙනවා. ඉතින් මමත්, බාධක කම්මටොළු යන මඩ ගොහොර තුලින් නෙළුම් මලක් බවට පත් වීම වැදගත් බව අවබෝධ කරගත්තා.

එක දවසක්, කන්චන් ශිබුචෝ සාන් මට, 'ඔබට විශාල පිං බලයක් තිබෙනවා, නමුත් මම ඔබ තරහ ගන්නා විට එම පින එළියට එන්නේ නැහැ' යැයි කීවා. මම එතුමාගේ කතාව අවංකව අසා සිටියා. ඉන්පසු මම, ඔහු කියූ දේ සෑම විටම මතක තබා ගෙන කටයුතු කලා. එවිට කිසිවෙකු මාගේ සතුරන් නොවේ. මාගේ තරහව මාගේ විශාලතම සතුරා බව අවබෝධ කරගත්තා. අන් අයට පීඩාකාරී දේ කලහොත්, ඊට සමගාමීව තමාත් පීඩාවට පත් වනවා.

'තමා වෙනස් වුනොත් අන් අයද වෙනස් වේ' යැයි නික්යෝ නිවානෝ තුමා කියාදී තිබෙනවා. මාගේ වෙනස් වීමේ පදනම වූයේ 20 වන පරිච්ඡේදයේ අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ ඉගැන්වීමයි. ජපානයේ නෙරීමා ධර්ම ශාඛාවට ධර්ම පුහුණු වීම් වලට ගොස් සිටි කාලයේ වුන සිද්ධියකි. එම ප්‍රදේශයේ කසෂි ශිබුචෝ සාන් සමඟ, සාමාජිකයන් නොවන නිවෙස් වලට ධර්ම ප්‍රචාරය සඳහා ගියා. කෝසෙයි කායි සඟරාද රැගෙන සාමාජිකයන් නොවන නිවෙස්වලට යාම සිදුකලා. බොහෝ ප්‍රමාණයක්

අය අපිට නොසලකා හැරියා. අන් අය 'මෙය අත්‍යාවශ්‍ය දෙයක් නොවේ. කරදර කරන්න එපා.' යැයි අපිට කෝපයෙන් බැණ වැදුනා. එම දවස්වල මම කලකිරුණා.

දිවා ආහාරය ගන්නා විට, මම කසෙෂි ශිබ්‍රචෝ සාන්ගෙන් 'ගොඩක් අය අපිව නොසලකා හැරියා, එම නිසා දුක නැද්ද' කියා ඇසුවා. එවිට, කසෙෂි ශිබ්‍රචෝ සාන් මට අගර්හිත බෝධිසත්වයන් ගැන කියාදී, 'මෙම ධර්ම ව්‍යාප්තියේ අරමුණ අන් අය සමඟ ධර්මය බෙදාහදා ගැනීම පමණක් නොවේ. තමන්ගේ හදවත පිරිසිදු කරගැනීම, මෙම ධර්ම පුහුණුවේ තවත් අරමුණක්ය. මිනිසුන් අපි නරක අය ලෙස දොස් කියමින් උපහාසයට ලක් කරනවා. එසේ කලත් අපි නිහඬව එය විඳදරාගෙන ධර්මය බෙදාහදාගෙන, දුක් කම්කටුළු අඩු කරගැනීමට වෙහෙසවී කටයුතු කරනවා. එතුලින් තරහව වැනි අපි තුල තිබෙන අපිරිසිදු හදවත පිරිසිදු කිරීමට  ධර්මය පුහුණු කරමින් සිටිනවා.' යැයි පැවසුවා.

ඇත්ත වශයෙන්ම මට තරහා යන හදවතක් තිබුනා. අගර්හිත බෝධිසත්වයන් වහන්සේ ගැන ඉගෙන ගැනීමෙන් පසු, මම ටික ටික මගේ හදවත පාලනය කර ගැනීමට හැකිවිය. කොක්ස් බසාර් වල සාමාජිකයන් එකතු වනවිට සෑම විටම පාහේ අරිතොමි කියෝකයිචෝ සාන්, මගේ තරහව මැඩපවත්වා ගන්නා ආකාරය පැවසුවා. තරහව සම්පූර්ණයෙන් පාලනය කරගත්තේ නැති වුනත්, පෙරට වඩා මම ගොඩාක් වෙනස් වී ඇතැයි සිතෙනවා. පෙර මෙන් තරහා ගන්නේ නැතිව සිටින මම, මගේ ගැන ආඩම්බර වෙනවා.

සාමාජිකයන්ගේ පිහිටෙන්, ධර්මයේ ආලෝකයෙන් මා ගැන පසු විපරම් කර සතුට අත්විඳීමට හැකිවිය. එසේම බුදුදහම ප්‍රඥවේ ඉගැන්වීම යැයි අවබෝධ විය. සූත්‍ර පොතේ තෙරුවන් සරණයාම තුළ තිබෙන 'අපි සියලු සත්වයන් සමඟ' එය හදවත තුල රඳවගෙන, වැඩ කටයුතු කරමින් සිටිනවා. තමන් තමාව පිරිසිදු කරගෙන පවුල, සමාජය, රට, ලෝක සාමය වෙනුවෙන් මේ ජීවිත කාලය කැප කරමින් කටයුතු කරන බවට දිවුරා පොරොන්දු වෙමි. මාගේ සෙප්පෝව මෙතනින් අවසාන කරනවා.

සියළු දෙනාටම බොහොම ස්තූතියි.




*තරුණ සාමාජිකයන් සමඟ සිටින රුමන් මහතා*

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 12 වන පරිච්ඡේදය, දේවදත්ත (පෙර කොටස)

'ස්තූපයක් පොළොවෙන් මතුවී ඒම යන 11 වන පරිච්ඡේදයේදී', 'මනුෂ්‍යයන්ගේ ඇතුලාන්තය තුල බුද්ධ ශක්තිය පවති' යන වැදගත්ම කාරණය පැහැදිලි කළහ. එසේනම්, 'තමා තුල බුද්ධ ශක්තිය පවතින බව' අවබෝධ කර ගැනීම, නියම මනුෂ්‍යයෙකු ලෙස අංග සම්පූර්ණ වීමේ පළමු පියවර වනවා සේම, නියම මාර්ගයද වේ. උදාහරණක් ලෙස, වැරදි වැඩ කල පුද්ගලයෙක් හෝ කුඩා දරුවෙක් වේවා, තම බුද්ධ ශක්තිය නියමාකාරයෙන් අවබෝධ කරගෙන ප්‍රත්‍යක්ෂ කරගන්නේ නම්, සත්‍යාවබෝධය ලබා ගැනීමට හැකිවේ.

බුද්ධ ශක්තිය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය ඒ ආකාරයට පෙන්වන්නේ මෙම 'දේවදත්ත පරිච්ඡේදයෙනි'. මෙම පරිච්ඡේදය ප්‍රධාන කරුණු 2 කින් සමන්විතය. පළවන කරුණ නම්, 'වැරදි වැඩ කල පුද්ගලයෙකුට වුවද සත්‍යාවබෝධය ලබාගත හැකිය' යන්න හා දෙවන කරුණ 'කාන්තාවකට වුවද සත්‍යාවබෝධය ලබගත හැකිය' යන්න වේ.

### වැරදිවැඩ කල පුද්ගලයෙකුට වුවද සත්‍යාවබෝධය ලබාගත හැකිය

බුදුන් වහන්සේගේ පෙර භවය ගැන මෙහිදී මුලින්ම සදහන් කරයි. පෙර භවයේදී බුදුන් වහන්සේ රජ කෙනෙකු සිට ඉතා ප්‍රීතිමත් ජීවිතයක් ගත කරමින් සිටියද, ඒ ගැන සෑහීමක පත් නොවී, සත්‍ය වු ධර්මය සොයමින් කටයුතු කලහ. එම ධර්මය වෙනුවෙන් තමාගේ සියළුදෙයම පරිත්‍යාග කලත් කම්නැතැයි කල්පනා කලහ.

'සියළුදෙනාම දුකින් මුදවා ගැනීම සදහා ධර්මය දේශනා කරනා පුද්ගලයෙකු සිටියි නම්, මගේ මුළු ජීවිත කාලය තුලම ඔහුට සේවය කරමි' ලෙස රට පුරා අණ බෙර වාදනය මගින් දැන්වූහ.

එම අවස්ථාවේ ඍෂිවරයකු පැමිණ මෙසේ කියා සිටියහ, 'මා ලඟ ධර්මය ඇත, එනම් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යයි, රජතුමා මාහට සේවය කරන්නේ නම්, එම ධර්මය අනිවාර්යයෙන්ම දේශනා කරමි' ලෙස පැවසූහ.

රජු එම ඍෂිවරයාගේ වචන අසා ප්‍රීතියෙන් ඉපිල, ඍෂිවරයා පසු පස යමින් ආහාරයට පලතුරු අහුලා දුන්හ, ජලය ගෙන දුන්හ, දර අහුලා දුන්හ, ආහාර සුදානම් කර දුන්හ, තම ශරීරය පවා ආසනයක් කර පිරිනැමූහ. මෙලෙස දීර්ඝ කාලයක් තම සේවය පිරිනැමුවේය. ඒ ආකාරයට විශිෂ්ඨ වු ධර්මය ශ්‍රවණය කිරීමට හැකිවුවේය.

එසේම 'මට මේ ආකාරයට ධර්මාවබෝධය ලබා ගැනීමට හැකි වුවේද, පෙර භවයෙහි කල එම පුහුණුව නිසාය. එම ඍෂිවරයා නම්, දේවදත්තගේ පෙර භවයයි. දේවදත්තගේ පිහිටෙන් මේ ආකාරයට බුදු බව ලබා විශාල පිරිසක් දුකින් මුදවා ගැනීමට හැකි විය' ලෙස පැවසූහ. එසේම, 'දේවදත්තයන් මින් ඉදිරියට කරන්නාවු ධර්ම පුහුණුව තුලින් අනිවාර්යයෙන්ම සත්‍යාවබෝධය ලබා ගන්නේය' සේ විවරණ ලබා දුන්හ.

දේවදත්ත යනු බුදුන් වහන්සේගේ ඥාති සහෝදරයා වනවා සේම, ශ්‍රාවකයෙකු ලෙසද කටයුතු කළහ. දේවදත්තයන් ඉතා ඥානවන්තයෙකු වුවත් හදවතේ විපරීත බව නිසා නිතරම විරුද්ධවාදීකම් කරමින්, සාමය බිද දැමීමට කටයුතු කලහ. බුදුන් වහන්සේගේ ජීවිතයටද හානි පමුණුවන ආකාරයට කටයුතු කළ පුද්ගලයෙක් වුහ. ඒ ආකාරයට ද්‍රෝහිකම් කළද, දේවදත්ත යනු මාගේ කල්‍යාණ මිත්‍රයාය, ඒ පිහිටෙන් සත්‍යාවබෝධය ලබා ගැනීමට හැකිවිය ලෙස දේශන කළ අතරම, දේවදත්තයන්ද සත්‍යාවබෝධය ලබා ගන්නා බවට විවරණ දීම පුදුම සහගතය.

### පරිපූර්ණ වු කෘතවේදී හැඟීමෙන්

බුදුන් වහන්සේ පෙර භවය ගෙනහැර දක්වමින්, 'දේවදත්තයන්ගේ පිහිට නිසා' ලෙස දේශනා කළ වදලහ.



බුදුන් වහන්සේ හා සමාන පිරිසිදු හදවතකින් සිටින විට, යහපත් දේ හෝ අයහපත් දේ යන සෑම දෙයම සත්‍යාවබෝධ ලබා ගැනීමට හේතුපාදක කරගන්නේය. ඒ අනුව මෙලොව තිබෙන සියළුම දේ, තමා අවට සිදුවන සෑම සිදුවීමක්ම තමාට සත්‍යාවබෝධය ලඟාකර ගැනීමට පාදක වන කරුණු බැවින් ස්වභාවයෙන්ම කෘතවේදී හැඟීම ඇතිවේ.



ඒ ආකාරයට 'යහපත් හෝ අයහපත් යන සියළුම දේ, තම සත්‍යාවබෝධය ළඟා කර ගැනීමට හැකි හේතුකාරණ සේ භාරගෙන, කෘතවේදීවීම' යන පරිපූර්ණ හැඟීම අපිද ගැඹුරින් අධ්‍යනය කළ යුතු වේ. එම කරුණ මෙම පරිච්ඡේදයේ මුල් කොටසෙහි ඇත වැදගත්ම කරුණ වේ.

එසේම, දේවදත්ත වැනි නරක පුද්ගලයන්ට වුවද සත්‍යාවබෝධය ලබා ගන්නා බවට විවරණ දුන්නේ මන්ද? බුදුන් වහන්සේට සත්‍යාවබෝධය ලබා ගැනීමට දේවදත්තයන් කළ නරක වැඩ පාදක වූ නිසා දේවදත්ත ජයගත්තා නොවේ. එසේම, ඒ තුලින් දේවදත්ත කළ නරක වැඩ අවලංගු වුනේද නැත. එම නිසා දේවදත්තයන්ට පල කල 'කෘතවේදීත්වයට' හා 'විවරණ ලබාදීම' අතර කිසිම සබැඳියාවක් නොමැත.

බුදුන් වහන්සේ නිතරම දේශනා කළ 'සෑම සියළු මනුෂ්‍යයෙකුටම එක හා සමානව බුද්ධ ශක්තිය තිබේ' යන සත්‍යයට මනුෂ්‍යයන්ගේ හදවත බද්ධ කර, විස්මය ජනක හැඟීමක් ඇති කරවීමට දේවදත්තයන්ව උදාහරණය ගත්තා පමණී.

එනම්, විශාල පිරිසකට බුද්ධ ශක්තිය කෙරෙහි මඟ පෙන්වීමට බුදුන් වහන්සේ කළ සුළු උපායකි.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P121-P126

# Director's Column

## හදවතේ සතුට ප්‍රකාශ කරමු.

දෙසැම්බර් මාසයත් සමඟ, 2019 වසර නිමාවට පත්වෙනවා. මේ වසර ඔබ සියළුදෙනා ගත කලේ කෙසේද?

මේ වසර දෙස නැවත හැරී බැලීමේදී, ‘ඇමරිකාවට ධර්මය ව්‍යාප්ත වීමේ 60 වන සංවත්සරය සැමරුවා’, හවායි, ලොස් ඇන්ජලීස් හා ශාන්ත ෆ්‍රැන්සිස් ප්‍රදේශ වල ධර්ම ශාඛාවන් වල ඔවුනොවුන්ගේ සංවත්සර උත්සව පැවැත්වුවා.

බුදු පිළිම ප්‍රධානෝත්සවය හා ධර්මාචාර්යය ප්‍රධානෝත්සව තුලින් විශාල බෝධිසත්වයන් පිරිසක් බිහි වුනා. මේ වසරේ ප්‍රථමවතාවට තායිලන්තයේ ධර්මාචාර්යය ප්‍රධානෝත්සවයක්ද පැවැත්වෙනවා. දකුණු ආසියානු හා අග්නිදිග ආසියාවේ නායක හා තරුණ සම්මන්ත්‍රණද පැවැත්වුවා. ලොව පුරා ශාඛා වල සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගන්නා ධර්ම සම්මන්ත්‍රණද පැවැත්වුවා. ඇමරිකාවේ පැවති සම්මන්ත්‍රණයේදී ධර්මය හා හමුවීමේ සතුට ගැනද සැවොම ප්‍රකාශ කලා.

ඒ ආකාරයට හදවතේ සතුට විශාල ලෙස ඇති වුනා අවුරුද්දක් බවට මේ වසර පත්වුනාද? අපි එකිනෙකා අත්වින්ද එම සතුටේ ආනිශංස හා දියුණුව, එක් කෙනෙක් හෝ වැඩි පිරිසකට කියාදෙමු.

කෝයිචි සයිතෝ මහතා
ප්‍රධානී, අන්තර්ජාතික මූලස්ථානය, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය





We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: info@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 FAX: 1-650-359-6437
Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
2F Ikh Mandal building, Khurenbulag bag, Bayan-Undur sum,
Orkhon province, Mongolia

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**